" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

**ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත**

**பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்**

**OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE**

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

SLSI SYSTEM CERTIFIED ISO 9001
SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

මගේ අංකය / எனது இலக்கம் / My No. } CSWP/FIN-BD/02/FI/09-2020 (B)
ඔබේ අංකය / உமது இலக்கம் / Your No. }
දිනය / திகதி / Date } 2021.02.08

අයවැය චක්‍රලේඛ 01/ 2021

බස්නාහිර පළාතේ සියලුම ලේකම්වරුන්,

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/ පිරිස් හා පුහුණු/ මූල්‍ය/ සැලසුම්/ ඉංජිනේරු),

දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

## 2021 වර්ෂයේ බස්නාහිර පළාත් සභා වියදම් පාලනය

කොවිඩ් - 19 වෛරස ව්‍යාප්තිය හේතුවෙන් ඇති වී ඇති අයහපත් තත්ත්වයට 2021 වර්ෂයේදී ද මුහුණ පෑමට සිදු වන බවත්, මෙම අයහපත් තත්ත්වය පළාත් සභා අරමුදලට ලැබිය යුතු ආදායම් අපේක්ෂිත පරිදි නොලැබීමට හේතු වන බවත් අපේක්ෂා කළ හැකිය. ඒ අනුව 2021 වර්ෂයේ මුදල් ප්‍රකාශයෙන් වෙන් වී ඇති ප්‍රතිපාදන ඒ අයුරින්ම වියදම් දැරීම අපහසු වන බැවින් 2021 මුදල් ප්‍රකාශය යටතේ සලසා දී ඇති මූල්‍ය ප්‍රතිපාදන සීමා කිරීමට සිදුව ඇත. මෙයට අමතරව 2021.01.01 දින සිට ක්‍රියාත්මක කළ යුතු අංක 02/2021 සුරා බදු නිවේදනයෙන් සිදු කර ඇති ගාස්තු සංශෝධනය නිසා පළාත් ආදායමට අහිමි වන ආදායමද මෙම තත්ත්වය වඩාත් අයහපත් වීමට බලපානු ඇත. මෙම සියලු කරුණු සලකා බලා 2021 වර්ෂයට මුදල් ප්‍රකාශයෙන් සලසන ලද ප්‍රතිපාදන පහත සඳහන් පරිදි සීමා කිරීමට ගරු ආණ්ඩුකාරතුමන් විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/2/19/08 හා 2021.02.08 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇත. ඒ අනුව සියලුම ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්, ගණන් දීමේ නිලධාරීන් පහත උපදෙස් පරිදි කටයුතු කළ යුතු බව අවධාරණය කරමි.

1. 2021 මුදල් ප්‍රකාශයේ මූල්‍යකරණ අංක 12 යටතේ පහත සඳහන් වැය විෂයයන් වෙත වෙන් කර ඇති ප්‍රතිපාදන වියදම් දැරීමේදී දක්වා ඇති පරිදි කටයුතු කිරීම.

   I. 2102 (12) (ගෘහභාණ්ඩ හා කාර්යාලයීය උපකරණ) - වෙන් කර ඇති ප්‍රතිපාදනයෙන් 50% කට නොඅඩු ප්‍රතිශතයක් ඉතිරි කිරීම.

   II. 2103 (12) (යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ) - කාර්යාල උපකරණ මිලදී ගැනීම සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදනයන්ගෙන් 50% කට නොඅඩු ප්‍රතිශතයක් ඉතිරි කිරීම. (ඇතැම් දෙපාර්තමේන්තු සඳහා විශේෂ යන්ත්‍ර හා උපකරණ මිලදී ගැනීමට වෙන් කර ඇති ප්‍රතිපාදන වියදම් දැරීමේදී මෙම සීමාවන් අදාළ කර ගත යුතු නොවේ.)

2. සියලු අමාත්‍යාංශ යටතේ අමාත්‍යවරයා සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇති ව්‍යාපෘති 01 හි ප්‍රතිපාදන වියදම් දැරීම සම්බන්ධව මගේ සමාංක හා 2021.01.18 දිනැති ලිපියෙන් ලබා දුන් උපදෙස් පරිදි කටයුතු කිරීම.

3. සභා ලේකම් කාර්යාලයෙහි වැය ශීර්ෂ අංක 101 හි ව්‍යාපෘති 01 හි ප්‍රතිපාදන වියදම් දැරීම සම්බන්ධව මගේ සමාංක හා 2021.01.18 දිනැති ලිපියෙන් ලබා දුන් උපදෙස් පරිදි කටයුතු කිරීම.

4. අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ පුහුණු වැඩමුළු හා සේවා සැසි සඳහා වෙන් වී ඇති ප්‍රතිපාදන වියදම් දැරීම, නැවත දැනුම් දෙන තුරු අත්හිටුවනු ලැබේ. කෙසේ වෙතත් අත්‍යවශ්‍යයෙන්ම පැවැත්විය යුතු පුහුණු වැඩමුළු හා සේවා සැසි වෙතොත් එම පුහුණු වැඩමුළුවට හෝ සේවා සැසියට අදාළ සවිස්තරාත්මක ව්‍යාපෘති යෝජනාව මාගේ පූර්ව අනුමැතියට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව පමණක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ හැකිය. පුහුණු වැඩසටහන් හැකිතාක්දුරට තාක්ෂණික ක්‍රමවේද භාවිතා කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. ගුණාත්මක යෙදවුම් වැය විෂයයෙහි පාසල් පාදක ඉගෙනුම් ප්‍රවර්ධන ප්‍රදානයන් යටතේ සැලසී ඇති ප්‍රතිපාදන පාසල් පවත්වාගෙන යාමේ කටයුතු සඳහා අත්‍යවශ්‍ය වියදම් දැරීම සඳහා පමණක් භාවිතා කළ යුතු අතර ඒ පිළිබඳව ඇති ඉල්ලීම් මා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතුය. එමෙන්ම අධ්‍යාපන ගුණාත්මක සංවර්ධනය යටතේ සැලසී ඇති ප්‍රතිපාදනවලින් පාසල් අවසාන වාර පරීක්ෂණ සඳහා වන වියදම් දැරිය හැකි අතර ඒ සඳහා මාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය. එම ඉල්ලීම් 2020 වර්ෂයේ දරන ලද වියදම්ද සමග ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

5. ප්‍රතිපාදන වෙන් වන සියලු ශීර්ෂයන්ගේ පහත සඳහන් වැය විෂයයන් හැර අනෙකුත් සියලු පුනරාවර්තන වැය විෂයයන්ගේ සමස්ත ප්‍රතිපාදන එකතුවෙන් 20% ක ප්‍රතිශතයක් ඉතිරි කිරීමට කටයුතු කළ යුතුය. (බත්තරමුල්ල නව පළාත් සභා සංකීර්ණයේ පරිපාලන වියදම් වෙනුවෙන් ප්‍රධාන ලේකම් වෙත පවරා දෙනු ලබන ප්‍රතිපාදන සඳහා මෙම විධිවිධාන අදාළ නොවේ.)

    1001 - වැටුප් හා වේතන
    1003 - වෙනත් දීමනා
    1203 - ආහාර පාන හා නිල ඇඳුම්
    1404 - බදු කුලී හා පළාත් පාලන ආයතන බදු
    1406 - කල්බදු වාහන සඳහා පොළී ගෙවීම්
    1408 - මෙහෙයුම් කල් බදු ක්‍රමයට ප්‍රසම්පාදිත වාහන සඳහා වාරික ගෙවීම්
    1503 - පළාත් පාලන ආයතන වැටුප් ප්‍රතිපූරණය
    1504 - සංවර්ධන සහනාධාර යටතේ ව්‍යවස්ථාපිත ආයතන සඳහා වැටුප් හා දීමනා
    1506 - රජයේ සේවකයන් සඳහා දේපළ ණය පොළී

6. පළාත් මූල්‍ය රීති 30 අනුව ගණන් දීමේ නිලධාරීන් වෙත මෙතෙක් බලය පැවති මාරු කිරීමක් වුවද ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අනුමැතිය මත සිදු කළ යුතුය. අනුමැතිය ලබා දීමේදී අදාළ මාරු කිරීම් කල් දැමිය නොහැකි අත්‍යවශ්‍යම වියදම් සඳහා වන බවට ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් වගබලා ගත යුතුය. ප්‍රධාන ලේකම්/ පළාත් භාණ්ඩාගාරය විසින් බලය ලබා දිය යුතු මාරු කිරීම් සඳහා මූල්‍ය රීති අනුව පවතින ක්‍රමවේදයේ වෙනසක් සිදු නොවේ.

7. නැවත දැනුම් දෙන තුරු සියලුම උත්සව, සම්මන්ත්‍රණ හා සම්මේලන නතර කළ යුතු අතර ඒවා වෙනුවෙන් වියදම් දැරීම සිදු නොකළ යුතුය. කාලීන අවශ්‍යතා මත නොවැළැක්විය හැකිව සංවිධානය කළ යුතු යම් සම්මන්ත්‍රණයක් හෝ සම්මේලනයක් වේ නම් සවිස්තරාත්මකව මාගේ පූර්ව අනුමැතියට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඒ සඳහා අනුමැතිය ලබා දීම සලකා බලනු ලැබේ.

8. ගෙවීම් කටයුතු කිරීමේදී ගමන් වියදම්, අතිකාල, සන්නිවේදන, ජල විදුලි බිල්පත්, ආරක්ෂක, සනීපාරක්ෂක සේවා ආදී මාසිකව ගෙවිය යුතු ගෙවීම් ඊළඟ මාසයේ දී ගෙවා නිම කරන ලෙසත් වර්ෂයේ මුල් කාර්තුවේ සිටම ගෙවීම් කිරීමට හැකිවන පරිදි ප්‍රසම්පාදන සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙසත් කාරුණිකව දන්වා සිටිමි. අවසන් කාර්තුවේදී ගෙවීම් කිරීමට සිදු වීමෙන් ඇති වන ද්‍රවශීලතා අපහසුතා වළක්වා ගැනීමට 2021 වාර්ෂික ප්‍රතිපාදන උපයෝජනයේදී සැලකිලිමත් විය යුතුය.

9. ශීර්ෂ අංක 107 හි වැය විෂයයාංක 1504 යටතේ මාර්ග සංවර්ධන අධිකාරියට, මාර්ග සංවර්ධනය ඇතුළු ආදායම් ආධාර වශයෙන් වෙන් කර ඇති රුපියල් මිලියන 400 න් රුපියල් මිලියන 300 ක මුදලක් වියදම් දැරීම නැවත දැනුම් දෙන තුරු අත්හිටුවනු ලැබේ. අත්හිටුවා නොමැති රුපියල් මිලියන 100 ට අදාළ ව්‍යාපෘතිවලට අදාළ විස්තර මා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතුය.

10. අතිකාල සේවාවන් සඳහා සේවකයන් යෙදවීම අත්‍යවශ්‍යම හා ප්‍රමාද කළ නොහැකි අවස්ථාවලට පමණක් සීමා කළ යුතු අතර, සෞඛ්‍ය, ආයුර්වේද දෙපාර්තමේන්තු හැර අනෙකුත් සියලු ශීර්ෂයන්හි නිවාඩු දින වැටුප් ගෙවීම මසකට දින 02 කට පමණක් සීමා කෙරේ. නොවැළැක්විය හැකි හේතුවක් නිසා යම් නිලධරයෙකු මීට අතිරේකව නිවාඩු දින සේවයෙහි යෙදවිය යුතු නම් ඒ සඳහා මාගේ අනුමැතිය ලබා ගත යුතුය.

11. ගමන් වියදම් සීමාවන් වැඩි කර ඇති තත්ත්වයක් යටතේ වුවද මෙම චක්‍රලේඛයේ පනවා ඇති සීමාවන්ද සැලකිල්ලට ගනිමින් වියදම් දැරීමට කටයුතු කළ යුතුය. ගමන් වියදම් සීමා වැඩි කිරීම එම වැය විෂයය සඳහා මූල්‍ය රීති අනුව ප්‍රතිපාදන සලසා ගෙන ගෙවීම් කිරීමට හේතුවක් නොවන බවද අවධාරණය කරමි.

12. යම් වියදමක් දැරීම අත්‍යවශ්‍යම වන හා එම වියදම නොදැරීම නිසා අයහපත් තත්ත්වයක් ඇති විය හැකි අවස්ථාවකදී ඉහත විධිවිධානයන්ට පරිභාහිරව කටයුතු කළ යුතු වුවහොත් එම තත්ත්වය වාර්තා කර ඒ සඳහා මාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.

02. වියදම් පිළිබඳ මූල්‍ය පාලනයක් කළ යුතු මෙවන් අවස්ථාවකදී පවතින ප්‍රතිපාදන දැඩි මූල්‍ය විනයකින් යුතුව හැසිරවීම සියලු ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්ගේ හා ගණන් දීමේ නිලධාරීන්ගේ වගකීමකි. ඉහත දී ඇති උපදෙස් තම අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුව යටතේ සිටින සියලු නිලධාරීන්ට දැනුම් දී එම නිලධාරීන්ද ඒ අනුව කටයුතු කිරීමට මෙහෙයවනු ඇතැයි දැඩි සේ බලාපොරොත්තු වෙමි. 2021 වර්ෂය තුළ දැඩි මූල්‍ය විනයකින් යුතුව කටයුතු කිරීමෙන් පළාත් සභා සේවාවන් විධිමත්ව හා අඛණ්ඩව පවත්වා ගැනීමට සියලු නිලධාරීන්ගෙන් ලැබෙන සහයෝගය ඉතා අගය කොට සලකමි.

ජේ.එම්.සී. ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම්,
පළාත් මුදල් අමාත්‍යාංශ ලේකම් හා
පළාත් භාණ්ඩාගාර ලේකම්,
බස්නාහිර පළාත.

පිටපත් :-

01. විගණකාධිපති.
02. ලේකම්, මුදල් කොමිෂන් සභාව.
03. සභාපතිවරු, ව්‍යවස්ථාපිත අධිකාරි - තම අධිකාරිවල මූල්‍ය පාලනය ඇති කිරීම සඳහා
04. අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)